සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## ඉතිහාසය

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 02 යි.**

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට අංක 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ලංකාවේ වඩාත් පැරණිම ගොවිතැන් ක්‍රමය ලෙස සැලකෙන්නේ,
(1) වී වගාව යි. (2) මඩ ගොවිතැන යි. (3) කපු වගාව යි. (4) හේන් වගාව යි.

(2) තෝනිගල සෙල්ලිපියේ ''අකලහස'' යනුවෙන් සඳහන් වේ. ඒ කුමක් ද?
(1) හේන් වගාව වෙනුවෙන් අයකල බද්දකි. (2) යල කන්නයයි.
(3) මහ කන්නයයි. (4) මැද කන්නයයි.

(3) වාරි කර්මාන්තයට කරන ලද විශිෂ්ඨ සේවය නිසාම '' **මින්නේරියේ දෙවියන්** '' ලෙස පිදුම් ලැබූ අනුරාධපුර යුගයේ පාලකයා කවුරුන් ද?
(1) මහා පරාක්‍රමබාහු රජු (2) මහසෙන් රජු
(3) වසභ රජු (4) පළමුවන අග්බෝ රජු

(4) අතීතයේ පැවති ''වෙළෙඳ නගර'' ඓතිහාසික මූලාශ්‍රවල හඳුන්වා ඇත්තේ,
(1) නිගම ලෙසයි (2) පූග ලෙසයි (3) පට්ටන ලෙසයි (4) පිටබිම ලෙසයි

(5) හෝපිටිගමුව වෙළෙඳ පොළෙහි සිදුවන අකටයුතුකම් නතර කිරීම සඳහා හතරවන උදය රජු විසින් පිහිටුවනු ලැබූ සෙල්ලිපිය කුමක් ද?
(1) මිහින්තලේ පුවරු ලිපිය (2) බදුලු ටැම් ලිපිය
(3) තෝනිගල සෙල්ලිපිය (4) කොන්ඩවට්ටවාන් සෙල්ලිපිය

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න නිවැරද නම් (✔) ලකුණ ද වැරදි නම් (✖) ලකුණ ද වරහන තුළ යොදන්න.**

(6) අනුරාධපුරයේ රජකළ මහාචූලි මහා තිස්ස රජු ශ්‍රමිකයෙකු ලෙස වෙස්වලාගෙන කුඹුරක අස්වනු නෙලීමට සහාය විය. ( )

(7) සිය දියණියන් සූප ශාස්ත්‍රයෙහි දක්ෂයන් බවට පත් කිරීම දෙමාපියන්ගේ වගකීමක් බව සමන්ත ප්‍රසාදිකාවේ සඳහන් වේ. ( )

(8) මානවම්ම කුමරු දෙවන දාඨෝපතිස්ස රජුගේ පුතෙකි. ( )

(9) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය රජු ලංකාව ආක්‍රමණය කළ විට පළමුවන සේන පරාජයට පත්විය. ( )

(10) මානවම්ම කුමරුට ලංකාවේ බලය ලබා ගැනීමට සේනාවක් ලබා දුන්නේ පල්ලව රජතුමා, දෙවන නරසිංහ වර්මන්ය. ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(11) විදේශ වෙළඳාමේ දී වැදගත් වරායක් වනුයේ .................................................................... යි. (ගොඩවාය, දඹකොළපටුන, කල්පිටිය)

(12) දිවා රාත්‍රී සිය මවට උපස්ථාන කිරීමෙන් .................................................................... රජු බොහෝ සතුටට පත් වූ බව මහා වංශයේ සඳහන් වේ. (I වන විජයබාහු, 8 වන අග්ගබෝධි, මහා චූලමහා තිස්ස)

(13) පාන්ඩ්‍ය රාජ්‍ය උරුමය ලබා ගැනීම සඳහා, ආධාර සේනා ලබා ගැනීමේ අරමුණින් .................................................................... නම් පාණ්ඩ්‍ය කුමරෙකු මෙරටට පැමිණීම. (නරසිංහ වර්මන්, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, II වරගුන්වර්මන්)

(14) පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර වන්නේ .................................................................... (මදුරාපුරය, කාන්චිපුරය, තන්ජෝරය)

(15) රුවන්වැලි සෑයේ අලංකාර කිරීමට පළඳනාවකට අවශ්‍ය පබළු රෝමයෙන් ගෙන් වූයේ .................................................................... (දුටුගැමුණු රජුය, කාවන්තිස්ස රජුය, භාතිකාභය රජුය, වලගම්බා රජුය)

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(16) පළමුවන විජයබාහු රජතුමා විසින් ............................................ වෙත ලබාදුන් වරප්‍රසාද රැසක් ගැන පනාකඩුව තඹ සන්නසෙහි සඳහන් වේ.

(17) තුන්නිකාය සමගි කොට පොළොන්නරු කතිකාවත පිහිටුවීමට පුරෝගාමී වූයේ ............................................ රජතුමාය.

(18) රට වැසියාගේ ශුබසාධනය ඇති කිරීම, තුළාභාර දානය දීම, දිළින්දන්ට සැලකීමටත් ............................................ රජතුමා කටයුතු කළේය.

(19) ශ්‍රී ලංකාව චෝළ බලයෙන් නිදහස් කර ගැනීමට ............................................ රජතුමා සමත් විය.

(20) යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුමයන් 704 ක් නම්කර ඇති අතර ඉන් ............................................ ශ්‍රී ලංකාවේ පිහිටා ඇත.

(ලකුණු 2 x 20 = 40)


## II කොටස

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(1) (අ) (i) යාබද සිතියමේ දී ඇති අක්ෂරවලට අදාළ නම් පහත සඳහන් ලැයිස්තුවෙන් තෝරා සිතියමේ අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න.

1. අනුරාධපුරය
2. නිල්වලා ගංගාව
3. ත්‍රිකුණාමලය
4. මහාතිත්ථ
5. පොළොන්නරුව
6. ගාල්ල

(ලකුණු 06)



(ආ) (i) A රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

**A රූපය**




(ii) මෙම නිර්මාණය කුමන කාර්යයක් සඳහා යොදා ගන්නා ලද්දේ ද?

(iii) පැරැන්නන් විසින් මෙවැනි නිර්මාණයක් කිරීමට හේතුව කුමක් ද?

(ලකුණු 3)

(ඇ) (i) යාබද B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

**B රූපය**



(ii) මෙම නිර්මාණය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?

(iii) මෙය කුමන පාලකයෙකු විසින් නිර්මාණය කරවන ලද්දක් ද? (ලකුණු 3)

(2) (i) අතීතයේ දී මෙරට වැසියන් ජීවනෝපාය සඳහා යෙදුනු වෘත්තීන් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) (a) පැරැන්නන් විසින් හේනක් ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(b) අතීතයේ දී මෙරට වැසියන් කෘමීන්ගෙන් හා කුරුල්ලන්ගෙන් වී වගාව ආරක්ෂා කර ගැනීමට අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) පුරාණ කාලයේ මෙරට වැසියන් සත්ත්ව පාලනය සිදුකල ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(3) (i) ශ්‍රී ලංකාව, අතීතයේ දී වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) (a) විදේශීය වෙළඳාම යටතේ මෙරටින් අපනයනය කරන ලද භාණ්ඩ වර්ග දෙකක් සඳහන් කරන්න.

(b) විදේශීය වෙළඳාමේ දී වැදගත් මෙරට වරායන් දෙකක් නම් කරන්න. (ලකුණු 4)

(iii) අතීතයේ දී ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමඟ දියුණු වෙළඳාමක් සිදුකළ බව කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(4) (i) (a) - අනුරාධපුර යුගයේ මෙරටෙහි පාලනය ගෙනගිය රාජවංශ දෙක නම් කරන්න. (ලකුණු 2)

(b) - පණ්ඩුකාභය රජුගෙන් පසු ලංකාවේ පාලන බලය ලබා ගත්තේ කවුරුන් ද? (ලකුණු 1)

(ii) ''මානවම්ම කුමරු රජවීමට පෙර මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) මානවම්ම කුමරු පාලන බලයට පත්වීම මෙරට දේශපාලන ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සලකන්නේ ඇයිදැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(5) (i) මධ්‍ය පාලනයේ ඉහළම පුද්ගලයා වූ රජුගෙන් ඉටුවිය යුතු කාර්යයන් 3ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(ii) (a) ලංකාවේ බහුල වශයෙන් රජකම උරුමවීමේ ක්‍රම දෙකක් නම් කරන්න.

(b) රාජ්‍ය පාලනයේ දී රජුට සහාය වූ නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 4)

(iii) අනුරාධපුර රජවරු සමාජ ශුභ සාධනය සඳහා කළ සේවාවන් 2ක් උදාහරණ මගින් පෙන්වා දෙන්න. (ලකුණු 5)

(6) (i) පළමුවන විජයබාහු රජු ගැන තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර 2ක් නම් කරන්න. (ලකුණු 4)

(ii) පළමුවන විජයබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ 2ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) (a) පළමුවන විජයබාහු රජුගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) විජයබාහු රජුගේ ආගමික සේවාවන් 3ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(7) (i) මහා පරාක්‍රමබාහු රජුගේ පියා හා මව සඳහන් කරන්න. (ලකුණු 3)

(ii) (a) පැරකුම් කුමරා උපන් ස්ථානයේ ඉදිකර ඇතැයි සැලකෙන චෛත්‍යය නම් කරන්න.

(b) රාජ්‍ය උරුමයේ සංකේතය වන දළදාව හා පාත්‍රාධාතුව ලබා ගැනීම සඳහා පරාක්‍රමබාහු රජු සටන් කළේ කා සමඟ ද? (ලකුණු 4)

(iii) (a) මහ පරකුම්බා රජු ආර්ථික සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග 2ක් සඳහන් කරන්න.

(b) නිශ්ශංකමල්ල රජු තම රාජ්‍ය පාලනයේ දී මුහුණ දුන් අභියෝග 2ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

(8) (i) ශ්‍රී ලාංකිකයන් සතු පාරම්පරිකව උරුම කර ගත් **අස්පෘශ්‍ය** උරුමයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(ii) යුනෙස්කෝ සංවිධානය ලෝක උරුමයන් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) (a) යුනෙස්කෝ සංවිධානය ශ්‍රී ලංකාවේ ලෝක උරුමයක් ලෙස නම් කරන ලද ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(b) ඔබ නම් කල එක් ස්ථානයක වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 3)